---

මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශිය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්විම් හා නිරික්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහනුවර කඩවත්සතර සහ ගගවට කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබියයුතු ආයුර්වේද ආධාර මුදල් රු.100,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2012 මාර්තු 15 දින රු.6,710,000 කට මිල දී ගෙන තිබු කැබ් රථයේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයට ලැබියයුතු මුද්දර ගාස්තු අදායම රු.6,133,538 ක් වුව ද, ඊට අදාළව හිග හිටි වෙනත් ආදායම් යටතේ දක්වා තිබු වටිනාකම රු.500,000 ක් විය. ඒ අනුව, හිග හිටි වෙනත් ආදායම් රු.5,633,538 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාළ ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.16,412,295 ක් වු අතර, ඊට අදාළව උපයෝගී ලේඛනයට අනුව ශේෂයන්ගේ එකතුව රු.13,661,011 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.20,634 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,272,187 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,254,458 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 9,928 | 6,494 | 7,765 |
| (ii) බදු කුලී | 89 | 118 | 172 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,272 | 2,014 | 131 |
| (iv) වෙනත් ආදායම් | 7,444 | 5,348 | 20,769 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 1,000,000 |
| (ii) මුද්දර ගාස්තු | 19,320,992 |

වර්ෂ 07 කට වඩා වැඩි කාලයක් ඉක්ම ගොස් ඇති රු.17,820,992 ක් වූ ලැබියයුතු මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ දීද, අය කර ගෙන නොතිබුණි.

2.2.3 දැන්වීම් පුවරු ගාස්තු

සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 05 ක් වෙනුවෙන් රු.15,600 ක මුදලක් අයකර නොතිබුණි.

2.2.4 පාරිසරික ගාස්තු

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ හා අංක 1534/18 හා 2008 පෙබරවාරි 01 දරන ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව කර්මාන්ත අලුතින් ඇරඹීමේ දී, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ද, එම කටයුතු පරීක්ෂා කිරීම වෙනුවෙන් පරීක්ෂණ ගාස්තුවක් ද වශයෙන් රු.7,000 ක මුදලක් අයකර ගත යුතු වුවද 2012 වසර සඳහා එසේ ආරක්ෂණ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කර ගෙන යනු ලබන ව්‍යාපාර 04 ක් වෙනුවෙන් රු.28,000 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

2.2.5 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු 07 ක් අනවසරයෙන් ඉදි කර තිබූ අතර, සභාව විසින් එම කුළුණු හඳුනා ගෙන අදාළ ගාස්තු අය කර ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව, දුරකථන/ විදුලි සංදේශ කුළුණ සඳහා උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් එකකටම රු.100 බැගින් ගාස්තු අය කළයුතු වුවත්, අනවසරයෙන් ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 07 ට අදාළව සභාවට දළ වශයෙන් රු.200,000 කට අධික මුදලක් අහිමි වී තිබුණි.

(ඇ) සම්ප්‍රේෂණ කුළුණු මගින් සන්නිවේදන පහසුකම් සපයා තිබූ සමාගම් අනුව වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අය කර ගත හැකි වුව ද, කුළුණු 12 ක් සඳහා විධිමත් ආකාරයෙන් බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණි. මේ හේතුවෙන්, අදාළ කාල සීමාවන්ට අදාළව රු.200,000 කට අධික මුදලක් සභාවට අහිමි වී තිබුණි.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සේවය කර, ස්ථාන මාරුවීම් ලැබූ, වැඩ තහනමකට ලක්වූ හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් වසර 01 සිට වසර 10 දක්වා වූ පරාසය තුළ අය අය විය යුතු රු.641,119 ක සේවක ණය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ පුස්තකාල 04 ක සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල දී විවිධ හේතු නිසා, නැති වූ හා අස්ථානගත වූ පොත්පත් 236 කට අදාළ වූ රු.37,035 ක වටිනාකම අය කර ගැනීමට හෝ වෙනත් පියවරක් ගෙන ගිණුම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වාහන පාලනය